# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/21 - 2016 නොවැම්බර් මස 09 වැනි බදාදා - 2016.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6 (i) ඡේදය සංශෝධනය කිරීම

1985 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 380/61 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6 (i) ඡේදය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරනු ලදුව, සංශෝධිත ඡේද දැනගැනීම සඳහා පළ කරනු ලැබේ.

මෙම සංශෝධනය 2007.09.11 වැනි දින සිට ක්‍රියාත්මක වනු ලැබේ.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 නොවැම්බර් මස 03 වැනි දින,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6 (i) ඡේදය සංශෝධනය කිරීම

1985 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 380/61 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6 (i) ඡේදය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරනු ලදුව, සංශෝධිත ඡේද දැනගැනීම සඳහා පළ කරනු ලැබේ.

''6 (i) පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් විසින් පත් කිරීම් බලධාරියා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලබයි.

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.''

11 - 1075